---

රිදීගම ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 22 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව රිදීගම ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට රිදීගම ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සැපයුම් ණයහිමි ශේෂය අදාල උපලේඛනය අනුව රු.7,408,244 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.4,802,316 ක් ලෙස ගැනීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණය හිමි ශේෂය රු.2,605,928 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල රු.16,276,468 ක වැටුප් ප්‍රතිපූරණ ගිණුම් ගතකිරීම වෙනුවට වර්ෂය තුල ලැබී තිබූ රු.13,509,920 ක් පමණක් ගිණුම් ගතකර තිබීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූරණ රු.2,766,548 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). 2010 හා 2012 වර්ෂයන්ට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබූ අතර ගිණුම් ගත කර තිබූ රු.8,014,615 ක් 2011 වර්ෂයට අදාලව ලැබිය යුතු රු.7,995,070 ක් හා 2009 වර්ෂයට අදාලව ලැබී තිබූ රු.19,545 කින් සමන්විත විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,106,177 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,226,750 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,834 | 1,039 | 2,676 |
| (ii) | බදුකුලී | 1,682 | 1,376 | 583 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 970 | 973 | 768 |
| (iv) | වෙනත් ආදායම් | 11,515 | 1,700 | 9,815 |

#### 2.2.2 වරිපනම් බදු

නව තක්සේරුවක් කර තිබූ සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් බිල් කිරීම රු.1,535,480 ක් වූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වරිපනම් හිඟය රු.2,414,394 ක් ලෙස බිල් කිරීම් මත සියයට 157 ක් විය. එකී හිඟබදු අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය සහ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 31-42 විධි විධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 බදුකුලී

රිදගම පොදු වෙළඳපල කඩ කාමර 3 කට අදාල රු.23,115 ක හිඟබදු ද 2005 වර්ෂයේදී කඩා ඉවත්කරන ලද කඩ කාමර 11 කට අදාල රු. 42,000 ක හිඟබදු ද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල්ව නොපැවතුණි. එමෙන්ම මාසිකව රු.200 බැගින් කුලී අයවන රිදිගම පොදු වෙළඳපල අංක 20 කඩ කාමරය වාරික මුදල් නොගෙවීම මත 2012 අප්‍රේල් 10 දින මුද්‍රා තබා තිබූ

අතර එදිනට අයවිය යුතුව පැවති රු.14,300 ක බදු මුදල සහ හේවාවිස්ස උපකාර්යාලයට අදාලව 2010 වර්ෂයේ සිට පැවත එන රු.25,099 ක හිඟ බදු ශේෂය ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

2.2.4 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

(අ). 2004-2006 කාලයට අදාලව හිඟ බලපත්‍ර ගාස්තු රු.845,750 ක් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150(4) හා 152(4) වගන්ති ප්‍රකාරව, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ). වෙළඳ බලපත්‍ර ගාස්තු යටතේ පැවති රු.658,325 ද කාලානරූපීව කටයුතු නොකිරීම හේතුවෙන් වර්තමානය වන විට අයකර ගැනීම ගැටළුකාරී වී තිබුණි.

2.2.5 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැර ගාස්තු</u>

සභාව පවත්වා තිබූ ලේඛන අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 18 ක් පැවති බව සඳහන් වුවද, පෙරසැර ගාස්තු ලෙස එක කුළුණක් වෙනුවෙන් රු.229,760 ක් පමණක් අයකර තිබූ අතර, කුළුණු 7 ක් වෙනුවෙන් රු.3,000 බැගින් වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර තිබුණි.

2.3 <u>බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම</u>

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් අදාල කොන්ත්‍රාත්කරුට සමාලෝචිත වර්ෂය තුල රු.4,113,817 ක් ගෙවා තිබූ අතර ඊට අදාලව ගෙවූ එකතු කල අගය මත බදු මුදල වූ රු.440,776 ක වටිනාකම සභාව විසින් ගෙවිය යුතු එකතු කල අගය මත බදු මුදල ගණනය කිරීමේදී අවකරණයක් ලෙස ගෙන නොතිබුණි.

2.4 <u>නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්</u>

(අ) සභාව සතුව පවතින රු.500,000 ක් වටිනා අත්ට්‍රැක්ටර් 2 ක් වසර 10 ක පමණ කාලයක සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. මේ සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදුකරන බව 2012 නොවැම්බර් 08 දින සභාපතිවරයා මා වෙත දන්වා තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 30 දින පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ මිනිරන්ගම ජල යෝජනා ක්‍රමයට මිලදීගෙන තිබූ රු.2,500,191 ක් වටිනා භාණ්ඩ එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම මත සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවතුණි.

2.5 <u>මානව සම්පත් කළමනාකරණය</u>

සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 65 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට තත්‍ය සේවක සංඛ්‍යාව 50 ක් විය. එතුල ව අනුමත කාර්මික නිලධාරි තනතුරු 3 න් 2 ක්ද, ආදායම් පරිපාලක

තනතුරු 3 න් 2 ක්ද, පුස්තකාලාධිපති තනතුරු 3 න් 2 ක්ද සමාලෝචිත වර්ෂය අවසානයට පුරප්පාඩුව පැවතුණි.

2.6 <u>මෙහෙයුම් /කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…2,909,925 ක් ව තිබුණි.

(ආ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 154(1) වගන්තිය අනුව, ඉඩම් කට්ටිකර විකිණීම් මත අයකල යුතු 1% බද්ද යටතේ 1997 වර්ෂයේ, කට්ටි සැලසුම් අනුමත කරන ලද පතිනිගොල්ල වත්ත නැමති ඉඩමට අදාලව ලැබිය යුතු රු.20,000 ක් ද 1998 හා 2001 වර්ෂවල කට්ටි සැලසුම් අනුමත කරන ලද ඉඩම් දෙකක් සඳහා පොදු පහසුකම් වෙනුවෙන් සභාවට ලැබිය යුතු පර්චස් 275 ක් පමණ වූ ඉඩම් කට්ටි 7 කට අදාල ඔප්පු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලැබී නොතිබුණි. පොදු පහසුකම් සඳහා සභාවට පවරා ගෙන තිබූ පර්චස් 75 පමණ වූ ඉඩම් කට්ටි දෙකක අනවසර ඉදිකිරීම් හා පදිංචිකරුවන් සිටින බවද අනාවරණය විය.

(ඇ) සභාව සතුව රු.37,769,444 ක් පමණ වටිනා ඉඩම් හා ගොඩනැගිලි පැවතියද ඒවා සම්බන්ධව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 218 විධිවිධාන පරිදි ඉඩම් හා ගොඩනැගිලි පිලිබඳව වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඈ) සභාවට අයත් හේවාවිස්ස හා දොඩම්ගස්ලන්ද මහජන පුස්තකාල වලට අදාලව (2005 වර්ෂයේ සිට) පැවත එන රු.21,582 ක් වටිනා පොත් 25 ක හා රු.64,372 ක් වටිනා පොත් 80 ක ඌණතාවයක් සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.7 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

රු.4,113,817 ක් වැයකර 2012 වර්ෂයේ නිමකරන ලද පිළිසරු ව්‍යාපෘතියෙහි කොම්පෝස්ට් නිෂ්පාදන කටයුතු 2012 දෙසැම්බර් මස ආරම්භ කර තිබුණද, කම්කරු අර්බුදයක් හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ වැඩකටයුතු එම වකවානුවේ සිට නවතා දමා තිබූ අතර, සභා බල ප්‍රදේශයේ එකතුවන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා අක්කර 25 ක පමණ හිස් ඉඩමක් යොදාගෙන පැවතිණි.

2.8 <u>කාර්ය සාධනය</u>

(අ). රු.1,223,675 ක් පමණ වැයකර කි.මී.16 ක පමණ මංමාවත් නඩත්තු කර පැවති අතර, බල ප්‍රදේශය තුල පැවති 55 ක් පමණ ව සුසාන භූමි නඩත්තුවත් වර්ෂය තුල සිදුකර නොතිබුණි. එමෙන්ම සභා බල ප්‍රදේශය තුල පවතින කාණු පද්ධති හා ළමා උද්‍යාන පිළිබඳව හඳුනාගැනීමක් කර නොතිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාලව සුභ සාධන කාර්යයන් 5 වෙනුවෙන් වෙන්කර තිබූ රු.415,000 ක මුදල අදාල කාර්යයන්ට යොදවා නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සදහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ). මානව සම්පත් කළමනාකරණය